# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන

6 වන කාණ්ඩය

දෙසැම්බර් 2020




01 පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සමඟ ඔන්ලයින් සාකච්ඡාවක්

02 මෙරට දිසා අධිකරණ වල නොවිසඳුණු නඩු 2.31.506ක්

03 ශ්‍රී ලංකාවේ පරිසර හානි මැඩලීමට ආරක්ෂක අංශ සහ වනජීවී දෙපාර්තමේන්තුවෙන් ඒකාබද්ධ වැඩපිළිවෙලක්

04 දකින සභා ගැබේ නොදකින පැතිකඩ සභා ලේඛන කාර්යාංශය

06 සත්ත්ව ඝාතනය පාලනය සඳහා දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනයට පියවර

06 වාහන නියාමනය පිළිබඳ නව ජාතික ප්‍රඥප්තියක්

06 2018 වසරේ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ හිඟ ආදායම



සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව





# පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව සමඟ ඔන්ලයින් සාකච්ඡාවක්

පාර්ලිමේන්තුවේ මූලාසනය හෙබවීමේදී අනුගමනය කළ හැකි ක්‍රමවේදයන් සහ තාක්ෂණික විධික්‍රම පිළිබඳව අවබෝධයක් ලබාගැනීම සඳහා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් සහ මෙරට මන්ත්‍රීවරුන් අතර සාකච්ඡාවක් පසුගියදා පාර්ලිමේන්තු පරිශ්‍රයේදී පැවැත්විණි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කාරක සභා සභාපති අංගජන් රාමනාදන් මහතා සහ පාර්ලිමේන්තුවේ සභාපති නාමාවලියට අයත් සාමාජික මන්ත්‍රීවරු අන්තර්ජාලය ඔස්සේ මෙම සාකච්ඡාව පැවැත්වූහ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතාද සහභාගී වූ මෙම සාකච්ඡාවේ අරමුණ වූයේ පාර්ලිමේන්තුවේ මූලාසනය වෙනුවෙන් කටයුතු කරන මන්ත්‍රීවරයන් විසින් සභා ගර්භය තුළ සිය කාර්යයන් ඉටු කිරීමේදී භාවිත කළ හැකි තාක්ෂණික උපක්‍රම සහ මෙවලම් පිළිබඳ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ භාවිතයන් ඇසුරින් අවබෝධයක් ලබා ගැනීමයි.

> “මෙම සාකච්ඡාවේ අරමුණ වූයේ පාර්ලිමේන්තුවේ මූලාසනය වෙනුවෙන් කටයුතු කරන මන්ත්‍රීවරයන් විසින් සභා ගර්භය තුළ සිය කාර්යයන් ඉටු කිරීමේදී භාවිත කළ හැකි තාක්ෂණික උපක්‍රම සහ මෙවලම් පිළිබඳ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ භාවිතයන් ඇසුරින් අවබෝධයක් ලබා ගැනීමය.”

බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායකවරිය වන ගරු ඩෝන් ප්‍රිමරෝලෝ මහත්මිය සහ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ හිටපු සාමාජිකයෙකු වන ඇන්ඩෲ කෙනන් මහතා ඇතුළු පිරිසක් මෙරට මන්ත්‍රීවරුන් දැනුවත් කිරීමට එක්වූහ.

# කුෂාණි රෝහණධීර මහත්මිය පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් සහ කාර්ය මණ්ඩල ප්‍රධානී තනතුරට



නීතිඥ කුෂාණි රෝහණධීර මහත්මිය පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් සහ කාර්ය මණ්ඩල ප්‍රධානී තනතුරට පත් කර තිබේ.

පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතාගේ නිර්දේශය මත, ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා ඒ සඳහා අනුමැතිය ලබා දී ඇත.

පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම් සහ කාර්ය මණ්ඩල ප්‍රධානී තනතුරේ කටයුතු කළ නීල් ඉද්දවල මහතා අභියාචනාධිකරණයේ විනිසුරුවරයෙකු ලෙස අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා ඉදිරියේ දිවුරුම් දීම හේතුවෙන් ඇති වූ පුරප්පාඩුවට රෝහණධීර මහත්මිය මෙලෙස පත්කර තිබේ.

රෝහණධීර මහත්මිය 2012 වසරේ සිට පාර්ලිමේන්තුවේ සහකාර මහලේකම්වරිය (පරිපාලන සේවා) ලෙස කටයුතු කළ අතර, ඇය පාර්ලිමේන්තු සේවයට එක්ව තිබුණේ 1999 පාර්ලිමේන්තු නිලධාරිනියක ලෙසනි. අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍යාවක වන ඇය කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යාවේදී උපාධිය හිමිකර ගත්තාය. අනතුරුව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධිය ලබාගත් ඇය නීති විද්‍යාලයෙන් නීතිඥ විභාගය සමත්ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක ලෙස ප්‍රතිඥා දී ඇත.

# මෙරට දිසා අධිකරණවල නොවිසඳුණු නඩු 2,31,506ක්



අධිකරණ සේවා කොමිෂන් සභාවට අනුව, මෙරට දිසා අධිකරණවලට යොමුව ඇති පැමිණිලි අතරින් මෙතෙක් විභාග නොවූ සහ විභාග වෙමින් පවතින නඩු සංඛ්‍යාව 2,31,506ක් බව අධිකරණ අමාත්‍ය අලි සබ්රි මහතා පාර්ලිමේන්තුවේදී පැවසීය.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ දත්ත අනුව මෙම නඩු අතරින්, වසර 01-05 අතර කාලයක් විභාග වන නඩු 49,801ක් ද, වසර 05-10 ත් අතර නඩු 20,586ක් ද, වසර 10-15ත් අතර කාලයක් තිස්සේ විභාග වන නඩු 8947 ද, වසර 15-20ත් අතර කලක් විභාග වන නඩු 3418ක් ද වසර 20-25ක් පැරණි නඩු 4620ක් ද ඇති බව මෙහිදී අනාවරණය කෙරිණි.

තවදුරටත් මෙම කරුණු පැහැදිලි කරමින් අධිකරණ අමාත්‍යවරයා කියා සිටියේ, නඩු දැමීම සහ නඩු ඇසීම යනු එකිනෙකට වෙනස් ක්‍රියාවලි දෙකක් වන බවයි.කෙසේ වෙතත්, කොවිඩ් 19 අභියෝගය නිසා මාස තුනක් තිස්සේ නඩු විභාග කිරීම නැවතී ඇති බව සඳහන් කළ අමාත්‍යවරයා පැවසුවේ එබඳු තත්ත්වයක් යටතේ වුවද සිවිල් අභියාචනාධිකරණයේ 70 කට අධික නඩු තීන්දු ගණනක් ලබාදී ඇති බවයි. එසේම, අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව තමන් මෙම සභාවට සහතික වෙන බවද අමාත්‍යවරයා පාර්ලිමේන්තුවේ දී සඳහන් කළේය.

පුවත්

# නව පොලිස්පතිවරයා සහ කථානායකවරයා අතර හමුවක්





නව පොලිස්පති සී.ඩී. වික්‍රමරත්න මහතා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා හමු විය.

මෙහිදී අදහස් දැක්වූ කථානායකරයා පැවසුවේ ශ්‍රී ලංකා පොලිසියට ජාතික වශයෙන් පැවරෙන වගකීම ඉටුකිරීම සඳහා, නව පොලිස්පතිවරයාට වැඩි අවධානයක් යොමු කිරීමට සිදුවන බවයි.

එමෙන්ම කථානායකවරයා, නව පොලිස්පතිවරයාට සුබ පැතුම් එක්කළ අතර, ශ්‍රී ලංකා පොලිසියේ කාර්යභාරය වඩාත් කාර්යක්ෂමව ඉදිරියට ගෙන යාම සඳහා කටයුතු කරන ලෙස ද ඉල්ලීමක් කළේය. පොලිස්පති සී.ඩී.වික්‍රමරත්න මහතා මෙරට 35 වැනි පොලිස්පතිවරයායි.



# ශ්‍රී ලංකාවේ පරිසර හානි මැඩලීමට ආරක්ෂක අංශ සහ වනජීවී දෙපාර්තමේන්තුවෙන් ඒකාබද්ධ වැඩපිළිවෙලක්

ශ්‍රී ලංකාව තුළ සිදුවන බව කියන වනාන්තර සංහාරය හා පරිසර හානි මැඩලීම සඳහා වනජීවී සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ආරක්ෂක අංශවල සහයෝගය දැක්වීමට රාජ්‍ය ආරක්ෂක අමාත්‍ය චමල් රාජපක්ෂ මහතා සිය එකඟතාවය පළ කළේය. සිදුවෙමින් පවතින පරිසර හානියට එරෙහිව, වනජීවී සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ආරක්ෂක අංශ අතර ඒකාබද්ධ මෙහෙයුමක් ක්‍රියාත්මක කරන බව අමාත්‍ය චමල් රාජපක්ෂ මහතා පවසා සිටියේය.

අමාත්‍ය චමල් රාජපක්ෂ මහතාගේ සභාපතිත්වයෙන් පාර්ලිමේන්තුවේ පැවැති ජාතික ආරක්ෂාව පිළිබඳව අමාත්‍යංශයීය උපදේශක කාරක සභාවේදී ඒ මහතා එසේ ප්‍රකාශ කළේ, වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍ය සී. බී රත්නායක මහතා විසින් කළ ඉල්ලීමකට අනුවය. මෙම කාරක සභාව සඳහා ගරු මන්ත්‍රීවරුන් තිහකට අධික සංඛ්‍යාවක් සහභාගීව සිටිනු දක්නට ලැබිණි.

මෙරට ශීඝ්‍රයෙන් සිදුවන ගස් කැපීම, වැලි ගොඩ දැමීම, මැණික් හෑරීම මෙන්ම ගවයන් දිගේලි කිරීම ආදී පාරිසරික ව්‍යසනයන් සම්බන්ධව කටයුතු කිරීමට තමන්ට ඇත්තේ සීමිත කාර්ය මණ්ඩලයක් බවද තවත් ප්‍රායෝගික හේතූන් නිසා වන සංරක්ෂණය සඳහා ආරක්ෂක හමුදාවන්ගේ සහයෝගය ලබා දීමට හැකිනම් එය මෙරට පාරිසරික සංරක්ෂණයට ඉමහත් පිටිවහලක් වන බවද වන ජීවී හා වන සංරක්ෂණ අමාත්‍යවරයා පෙන්වා දුන්නේය.

ඊට පිළිතුරු දෙමින් ආරක්ෂක ලේකම් කමල් ගුණරත්න මහතා කියා සිටියේ, ජනාධිපතිවරයාගේ නියෝගය අනුව සතියට තෙවතාවක් දිවයිනට ඉහළින් පියාසර කරන ගුවන් හමුදාව ඩ්‍රෝන ඡායාරූප මඟින් ශ්‍රී ලංකාවේ සිදුවෙමින් පවතින පරිසර හානිය දැනටම නිරීක්ෂණය කරන බවයි. අමාත්‍ය සී. බී. රත්නායක මහතාගේ ඉල්ලීමට අනුව පරිසරය රැක ගැනීමට ආරක්ෂක හමුදාවන්ගේ සහයෝගය ලබා දිය හැකි නමුත් වනජීවී දෙපාර්තමේන්තුවෙන් ද ඊට සහාය දැක්විය යුතු බව ආරක්ෂක ලේකම්වරයා වැඩිදුරටත් සඳහන් කළේය.

# දකින සභා ගැබේ නොදකින පැතිකඩ සභා ලේඛන කාර්යාංශය



“න්‍යාය පත්‍රය නැතුව පාර්ලිමේන්තුවේ සභාවේ කටයුතු පටන්ගන්න බෑ. පාර්ලිමේන්තු රැස්වීමක් තියෙනව නම්, සභාවේ කටයුතු පවත්වාගෙන යන්න අවශ්‍ය ලිපි ලේඛන සභා ලේඛන කාර්යාංශය සකස් කළ යුතුයි. ඒ නිසා සභා ලේඛන කාර්යාංශය කියන්නෙ පාර්ලිමේන්තුවේ හදවත වගේ තැනක්. මෙතන සක්‍රීය වෙන්නෙ නැතිව පාර්ලිමේන්තුවේ කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක වෙන්න නෑ. මේ නිසා ලොකු වගකීමක් අපිට තියෙනවා”. මෙසේ කියා සිටියේ පාර්ලිමේන්තුවේ සභා ලේඛන කාර්යාංශයේ සහකාර අධ්‍යක්ෂ ජනකාන්ත සිල්වා මහතාය.

පාර්ලිමේන්තුවේ ලිපි ලේඛන සියල්ල සම්බන්ධීකරණය කිරීම සහ එහි වගකීම දැරීම සිදුවෙන්නේ සභා ලේඛන කාර්යාංශයේ මූලිකත්වයෙනි. පාර්ලිමේන්තුවේ සභා ගර්භයේ කටයුතු සඳහා ලිපි ලේඛන බොහෝ ප්‍රමාණයක් අවශ්‍ය වෙයි. මේවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන සහ ස්ථාවර නියෝග අනුව භාෂාත්‍රයෙන්ම සකස් කොට සභාවට පිළිගැන්වීමට සභා ලේඛන කාර්යාංශය මූලිකත්වය ගනී.

පාර්ලිමේන්තුවේ න්‍යාය පුස්තකය හෝ ඒ හා සම්බන්ධ පරිපූරකය, න්‍යාය පත්‍රය, දවසේ වැඩපිළිවෙල, පාර්ලිමේන්තු කාර්ය සටහන් ආදිය සභා ලේඛන කාර්යාංශය සකස් කරන ප්‍රධාන ලිපි ලේඛනයි. ඉදිරි පාර්ලිමේන්තු රැස්වීම්වලට අදාළ සියලු ප්‍රශ්න, යෝජනා සහ පනත් කෙටුම්පත් දැනුම්දීම සඳහා මාස 3 -4 වරක් න්‍යාය පුස්තකයේ පළ කිරීම සිදුවෙයි. මේ සඳහා අතිරේක කරුණු එකතු කිරීමට අවශ්‍ය වූ විට ඒ හා සම්බන්ධ පරිපූරකය සකස් කෙරේ. පාර්ලිමේන්තුවේ රැස්වීම් පැවැත්වෙන සෑම දිනකටම අදාළව න්‍යාය පත්‍රයක් සකස් කරයි. න්‍යාය පත්‍රය අනුව පාර්ලිමේන්තුවේ සභාවේ එදිනෙදා කටයුතු පෙළගැස්වීම සිදු වෙයි.

“න්‍යාය පත්‍රයත් සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම සකස් කරනවා. ඇතැම් දිනවල පාර්ලිමේන්තුවේ කටයුතු අවසන් වෙන්නෙ රාත්‍රී 7.30ත් පහු වෙලා. මේ කොයි වෙලාවක පාර්ලිමේන්තුවේ කටයුතු අවසන් වුණත් පසුදා පාර්ලිමේන්තුව පවත්වන්න නම් අපි න්‍යාය පත්‍රය සහ අවශ්‍ය ලිපි ලේඛන සකස් කරන්න අවශ්‍යයි. අපි මේ ටික හරියට වෙලාවට නොකළොත් පසුදා පාර්ලිමේන්තුවේ කටයුතු ආරම්භ කරන්න බෑ. මේ නිසා අපි රාත්‍රී වෙනකම් හරි ඉඳල මේ වැඩ අවසාන කරලයි ගෙදර යන්නෙ. මේක ලොකු වගකීමක්” ජනකාන්ත මහතා පැහැදිලි කළේය.

“මෙතනදි තිරය පිටුපසත් බොහෝ කාරණා සිදු වෙනවා. අපි මේ අවශ්‍ය ලේඛන සකස් කරල මුද්‍රණය කරන්න රාත්‍රියෙම රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට යවනවා. මේ සියල්ල රාත්‍රියේම මුද්‍රණය කරල අධිවේගී තැපෑලෙන් මන්ත්‍රීවරුන් අතරේ බෙදාහරිනවා. උදේ වෙනකොට මන්ත්‍රීවරුන් අපිට දීපු ලිපිනයන්ට සහ



**එච්. ඊ. ජනකාන්ත සිල්වා මහතා**
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව

අවශ්‍ය අමාත්‍යාංශවලට පිටපත් ලැබෙන්න මේ විදියට අපි සලස්වනවා. ඒ වගේම උදේ 7.30 වන විට ඉතිරි පිටපත් පාර්ලිමේන්තුවට ගේනවා. මේ කාරණා හරි සංකීර්ණයි" ඔහු තවදුරටත් මෙම සංකීර්ණ ක්‍රියාවලිය පැහැදිලි කරමින් සඳහන් කළේය.

එසේම පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 22 හි දක්වා ඇති පාර්ලිමේන්තුවේ දවසේ වැඩපිළිවෙල සඳහා අවශ්‍ය වන කාරණා 15 ක් සම්බන්ධයෙන් වන ලිපි ලේඛන සකස් කිරීමේ වගකීමද සභා ලේඛන කාර්යාංශයට පැවරෙයි. පාර්ලිමේන්තුවේ සිදුවන කටයුතු පිළිබඳ නීත්‍යනුකූල වලංගුභාවයක් සහිත අවසාන ලේඛනයක් සකසයි. මෙම පාර්ලිමේන්තුවේ කටයුතු නීත්‍යානුකූලව සටහන් වන ලියවිල්ල එනම් පාර්ලිමේන්තු කාර්ය සටහන් සකස් කිරීමේ වගකීම දරන්නේද සභා ලේඛන කාර්යාංශයයි.

"සභාව පවත්වාගෙන යන්න මන්ත්‍රීවරුන්ගේ සහභාගීත්වය අත්‍යවශ්‍යයි. මේ මන්ත්‍රීවරු සියලු දෙනාගේම පාර්ලිමේන්තුවේ භාවිත කරන නම, රැස්වීම් පැවැත්වෙන දිනවල ලිපිනය, නියෝජනය කරන දේශපාලන පක්ෂය ආදී අත්‍යවශ්‍යම මූලික තොරතුරු පවත්වාගෙන යන්නෙත් සභා ලේඛන කාර්යාංශය විසින්. ඒ වගේම මන්ත්‍රී ජ්‍යෙෂ්ඨතා සහ සිංහල අකාරාදිය පිළිවෙලට නාම ලේඛන (Members' Information System) සකස් කිරීම සිදු කරන්නෙත් සභා ලේඛන කාර්යාංශය. මොකද මන්ත්‍රීවරුන්ගේ මේ තොරතුරු නිවැරදිව පවත්වා ගෙනයාම ඉතා වැදගත් වෙනවා" හෙතෙම පැවසුවේ ය.

මේ ආකාරයට පාර්ලිමේන්තුවේ කටයුතු නිවැරදිව පවත්වාගෙන යාමට කථානායකවරයාට, පාර්ලිමේන්තු මහලේකම්වරයාට හා ලේකම් මණ්ඩලයට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සභාලේඛන කාර්යාංශය වැදගත් සහයෝගයක් ලබාදෙන බව සඳහන් කළ යුතුමය.

***ආසිරි හපුගොඩ***
***මාධ්‍ය නිලධාරී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***

**පුවත්**

# සත්ත්ව ඝාතනය පාලනය සඳහා දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනයට පියවර



වර්තමානයේ දී සත්ත්ව ඝාතනය පෙර නොවූ විරූ ලෙස ඉහළ ගොස් ඇති බවත්, සත්ත්ව ඝාතකයන්ට එරෙහිව නීතිය දැඩිව ක්‍රියාත්මක කළ යුතු බවත් ජයන්ත වීරසිංහ මහතා කාරක සභාවේ දී අවධාරණය කළේය.

අසාධාරණ ලෙස සිදුවන සත්ත්ව ඝාතනය නැවැත්වීම සඳහා දණ්ඩ නීති සංග්‍රහය කඩිනමින් සංශෝධනයට පියවර ගන්නා බව වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍ය සී.බී. රත්නායක මහතා පැවසීය.

ජනාධිපති නීතිඥ පාර්ලිමේන්තු මන්ත්‍රී ජයන්ත වීරසිංහ මහතා වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ දී පසුගියදා මතුකළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් හෙතෙම මේ බව පැවසීය.

ව්‍යවස්ථාදායක කාර්ය පාර්ලිමේන්තුවට පැවරී ඇති බැවින්, සත්ත්ව ඝාතනය පාලනය සඳහා දණ්ඩ නීති සංග්‍රහය සංශෝධනය කිරීම කඩිනමින් සිදු කළ හැකි බව ද අමාත්‍ය සී.බී. රත්නායක මහතා මෙහි දී පෙන්වා දුන්නේය.

හීලෑ අලි ඇතුන් නියාමනයට කඩිනම් වැඩපිළිවෙලක් අවශ්‍ය බව ද වනජීවී හා වන සංරක්ෂණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ දී සාකච්ඡා වූ අතර, ඒ සඳහා අදාළ අණ පනත් සංශෝධනය කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කෙරිණි.

**පුවත්**

# කඩවත සිට මීරිගම දක්වා අධිවේගයේ කටයුතු මන්දගාමී වීම පිළිබඳව මහාමාර්ග ඇමතිවරයා වහාම වාර්තාවක් කැඳවයි



කඩවත සිට මීරිගම දක්වා දිවෙන අධිවේගී මාර්ගයේ කටයුතු ඉතා මන්දගාමීව සිදුවීමත්, එහි ඉලක්ක නිසි ලෙස සපුරාලීමට අපොහොසත් වීමත් පිළිබඳව සිය අප්‍රසාදය පළ කළ මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා ඒ පිළිබඳව වහාම වාර්තාවක් ලබා දෙන ලෙස මහාමාර්ග අමාත්‍යාංශයේ නිලධාරීන්ට නියෝග කළේය.

පසුගියදා පාර්ලිමේන්තුවේ පැවති මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේදී අමාත්‍යවරයා මේ නියෝග කළේය. ඒ අනුව අධිවේගී මාර්ගයේ කටයුතු වහා කඩිනම් කරන ලෙස නියෝග කළ අමාත්‍යවරයා තමන් සමඟ ඉදිකිරීම් කටයුතු නැරඹීමට පැමිණෙන ලෙස කාරක සභාවේ සියලු මන්ත්‍රීවරුන්ට ආරාධනා කළ අතර ඒ සඳහා ඉක්මනින් දිනයක් ද ලබා දෙන බව පැවසුවේය.

ඉදිකිරීම් කටයුතු මන්දගාමීව සිදු වුවද දෙවන ගෙවීම සිදු කරන ලෙස ඉල්ලීමක් ලැබී ඇති බව මෙම සාකච්ඡාවේදී අනාවරණය වූ අතර වහාම එම ගෙවීම් නතර කරන ලෙස අමාත්‍යවරයා නිලධාරීන්ට නියෝග කළේය. සංවර්ධන කටයුතු නිසි ලෙස සිදු නොවන ව්‍යාපෘතීන්ට මුදල් නොගෙවන ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා උපදෙස් දී ඇති බවද අමාත්‍යවරයා මෙහිදී පෙන්වා දුන්නේය.

මේ අතර අයිරෝඩ් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කෙරෙන මාර්ග සංවර්ධන වැඩසටහනට නුසුදුසු කොන්ත්‍රාත්කරුවන් යොදා ගැනීම නිසා ගැටලු රැසක් මතුවී, ව්‍යාපෘතිය ප්‍රමාද වී තිබෙන හෙයින් අදාළ කාල රාමුව තුළ වැඩ අවසන් නොකළ එවැනි කොන්ත්‍රාත්කරුවන්ගේ ගිවිසුම් තහනම් කිරීමටත් එම කොන්ත්‍රාත්කරුවන් අසාධු ලේඛනගත කරන ලෙසත් අමාත්‍යවරයා නියෝග කළේය. එම වැඩ අවසන් නොකරන ලද කොන්ත්‍රාත්තු අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් ඉවත් කර ඒවා සම්පූර්ණ කිරීම මහාමාර්ග අමාත්‍යාංශයේ ඉදිකිරීම් අංශය වෙත භාරදෙන බවද අමාත්‍යවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතාගේ සභාපතිත්වයෙන් පාර්ලිමේන්තුවේදී පැවති මහාමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට රාජ්‍ය අමාත්‍ය නිමල් ලන්සා මහතා ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ මහාමාර්ග අමාත්‍යාංශයේ ඉහළ නිලධාරීහු සහභාගි වූහ.

විශේෂාංග

# පාර්ලිමේන්තුව පැවැත්වෙන දිනක "පාර්ලිමේන්තුවේ කටයුතු" පිළිබඳ කෙටි විමසුමක්









ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ව්‍යවස්ථා සම්පාදනය සඳහා උත්තරීතර අධිකාරී බලයකින් යුක්ත වේ. එහිදී සිදුවන්නේ මහජන නියෝජිතයන් තුළින් ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කිරීමයි. එය පාර්ලිමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරයද වේ. පාර්ලිමේන්තු ස්ථාවර නියෝගවලට අනුව, එක් එක් මාසයේ පළමුව යෙදෙන ඉරිදාට පසුව එළඹෙන සතියෙන් ආරම්භ කරමින් ඒ ඒ සතියේ අඟහරුවාදා, බදාදා, බ්‍රහස්පතින්දා සහ සිකුරාදා දිනවලදී පාර්ලිමේන්තුව රැස්වේ.

එමෙන්ම පළමුවැනි සහ තුන්වැනි සති දෙකේදී පාර්ලිමේන්තුව රැස්වීම විශේෂත්වයකි. පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ තීරණයකට අනුව 2020 වසරේ සැප්තැම්බර් 22 වැනිදා සිට පාර්ලිමේන්තු රැස්වීම් පෙරවරු 10.00ට ආරම්භ කර පස්වරු 5.30ට අවසන් වේ. පස්වරු 4.30 සිට පස්වරු 5.30 දක්වා පැවැත්වෙනුයේ සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳ විවාදයයි.

ස්ථාවර නියෝග 22ට අනුව පාර්ලිමේන්තුව පැවැත්වෙන දිනක පාර්ලිමේන්තුවේ කටයුතු පැවැත්වෙන අනුපිළිවෙලක් පවතියි. ඒ අනුව පාර්ලිමේන්තුවේ කටයුතු ආරම්භ වන්නේ අභිනව මන්ත්‍රීවරයන්ගේ නිල ප්‍රතිඥාව හෝ දිවුරුම සමඟිනි. ඉන් අනතුරුව ජනාධිපතිවරයාගෙන් ලැබෙන සංදේශ කථානායකවරයා විසින් සභාවට ඉදිරිපත් කරනු ලබයි. කථානායකවරයා විසින් කරනු ලබන නිවේදන සභාවට ඉදිරිපත් කිරීම අනතුරුව සිදුවේ. ලිපිලේඛනාදිය පිළිගැන්වීම සහ කාරක සභා වාර්තා පිළිගැන්වීම සිදුවන්නේ මහජන පෙත්සම් පිළිගැන්වීමට පෙරය. ඉන් පසු වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වාරය ක්‍රියාත්මක වේ. අනතුරුව නොපැමිණීමේ අවසරය පිළිබඳ යෝජනා සහ අමාත්‍යාංශ නිවේදන සඳහා කාලය වෙන් වේ. ඉන් පසු සිදුවන්නේ මන්ත්‍රීවරයන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම් සහ වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්න ඉදිරිපත් කිරීමයි. ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී දැනුම්දීමක් අවශ්‍ය නොවන යෝජනා සහ ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී දැනුම්දීමක් අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම අනතුරුව සිදුවේ. ශෝක ප්‍රකාශ යෝජනා ඇත්නම් එය ඉදිරිපත් කිරීම අනතුරුව සිදුවන අතර, එසේත් නැත්නම් ප්‍රධාන වැඩකටයුතු ආරම්භවීම සිදු වේ.
දිනක ප්‍රධාන වැඩ කටයුතු කොටස් 02කින් සමන්විත වන අතර, දිනට නියමිත කටයුතු හා යෝජනා පිළිබඳ දැනුම්දීම් යන්න එම ද්විත්ව ප්‍රභේදයයි. යම් නියමිත දිනයකදී සැලකිල්ලට භාජනය කරනු ලැබිය යුතු යැයි පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලද පනත් කෙටුම්පතක්, නියෝගයක්, යෝජනා සම්මතයක් හෝ වෙනත් යම් කාරණයක් යම් දිනයකට නියමිත වැඩකටයුතු වේ. එසේ නියම කරන ලද දිනය වෙනුවට ඊට කලින් වූ දිනයක් යොදා ගත නොහැකිය. එක් එක් මාසයේ පළමුවැනි සිකුරාදා රැස්වීම හැර අනෙකුත් සෑම දිනයකම ආණ්ඩුවේ කටයුතු වෙනුවෙන් ප්‍රමුඛස්ථානය හිමිවේ. ඒ සම්බන්ධව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 23 (4) යටතේ පහත පරිදි දක්වා තිබේ.

*"අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු විසින් එක් එක් මාසයේ පළමුවැනි සිකුරාදා රැස්වීමේ ප්‍රධාන කටයුතු ආරම්භයේ දී "ආණ්ඩුවේ කටයුතු අද දින මුඛ්‍යස්ථානය ගත යුතුය" නැතහොත් "ආණ්ඩුවේ කටයුතුවලින් නිශ්චිතව දක්වා ඇති යම් කටයුත්තක් අද දින මුඛ්‍යස්ථානය ගත යුතුය" යනුවෙන් සංශෝධනයක් හෝ විවාදයක් නොමැතිව තීරණය කරනු ලැබිය යුතු යෝජනාවක් දැනුම් දීමක් නොමැතිව ඉදිරිපත් කරනු ලැබිය හැකිය.එවැනි යෝජනාවක් සම්මත වුවහොත්, ආණ්ඩුවේ කටයුතු හෝ නිශ්චිතව දක්වා ඇති කටයුත්ත ඒ අනුව මුඛ්‍යස්ථානය ගනු ලැබිය යුත්තේය".*

එමෙන්ම ආණ්ඩුව විසින් සුදුසු යැයි සලකනු ලබන අනුපිළිවෙළට ආණ්ඩුවේ කටයුතු වැඩසටහනට ඇතුළත් කිරීමද සිදුවේ. වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වාරය අවසන් වීමෙන් අනතුරුව ස්ථාවර නියෝග 27 (2) යටතේ අසනු ලබන ප්‍රශ්නය වර්තමානයේදී වැඩි අවධානයක් දිනාගෙන තිබේ. පොදු වැදගත්කමකින් යුතු කරුණක් සම්බන්ධයෙන් ප්‍රශ්නයක් අදාළ අමාත්‍යවරයාට විධිමත් ලෙස දැනුම්දීමකින් අනතුරුව පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශවයේ නායකවරයා හෝ පිළිගත් දේශපාලන පක්ෂයක නායකවරයකු විසින් විමසීම මෙහි දී සිදු වේ. සමස්තයක් ලෙස සැලකීමේදී පාර්ලිමේන්තුවේ සියලු කටයුතු පාර්ලිමේන්තු ස්ථාවර නියෝග ප්‍රකාරව සිදුවීම සම්ප්‍රදාය බව කිවයුතු මනාය.


*<u>විමර්ශිත ග්‍රන්ථ</u>*

*- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, (2018), "ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග", කෝට්ටේ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර.*

*- https://www.parliament.lk/si*



***එදිරිවීර ගුණසේකර***
***මාධ්‍ය නිලධාරී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***


# වාහන නියාමනය පිළිබඳ නව ජාතික ප්‍රඥප්තියක්



වාහන නියාමනය පිළිබඳ නව ජාතික ප්‍රඥප්තියක් සකසන බව ප්‍රවාහන අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා එම අමාත්‍යාංශයේ කාරක සභාවේදී පැවසීය. ඒ සඳහා උපදේශක කාරක සභාවක් ද පත් කර තිබේ. වාහන නියාමනයට අදාළ කටයුතු මධ්‍යම රජය සහ පළාත් සභා ඒකාබද්ධව ක්‍රියාත්මක කළ හැකිවන පරිදි නව ජාතික ප්‍රඥප්තිය සකසන බව ද අමාත්‍යවරයා කීවේය.

වාහන නියාමනය පිළිබඳ නව ජාතික ප්‍රඥප්තියට අදාළ පසුබිම් අධ්‍යයනය මේ වන විට සිදුකර අවසන් බව ප්‍රවාහන රාජ්‍ය අමාත්‍ය දිලුම් අමුණුගම මහතා කාරක සභාවේ දී පැවසීය. රට තුළ පවතින සියලු ප්‍රවාහන සේවා නියාමනයට හැකිවන පරිදි නව වැඩපිළිවෙළ ක්‍රියාත්මක කෙරේ. මාර්ගවල ධාවනයට සුදුසු පරිදි, වාහන ප්‍රමිතියකින් යුතු ද යන්න සොයා බැලීම වාහන නියාමනය පිළිබඳ නව ජාතික ප්‍රඥප්තියේ ප්‍රමුඛ අරමුණ බව ද හෙතෙම සඳහන් කළේය. දිවයින පුරා සිටින ත්‍රීරෝද රථ රියදුරන්ට හැඳුනුම්පතක් ලබා දීම සුදුසු බවට පාර්ලිමේන්තු මන්ත්‍රී ඩයනා ගමගේ මහත්මිය කාරක සභාවේදී යෝජනා කළ අතර, එය ද නව ජාතික ප්‍රඥප්තියට ඇතුළත් කර ඇතිබව රාජ්‍ය අමාත්‍යවරයා පැවසීය.

ග්‍රාමීය බස් සේවාව වැඩි දියුණු කිරීම සඳහා ද වත්මන් රජය නව වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බව පැවසූ අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා තෝරාගත් අඩු පහසුකම් සහිත ඩිපෝ කාර්යාල 10ක් නවීකරණය කරන බව ද පැවසීය.

මේ අවස්ථාවට ගරු අමාත්‍යවරු සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 30 කට අධික පිරිසක් සහභාගී වී සිටියහ.



## පුවත්

# සෞඛ්‍ය බලධාරීන්ගේ අනුමැතිය හිමිවූ වහාම කොවිඩ් මාර්ගෝපදේශ අනුව ගුවන්තොටුපළ විවෘත කිරීමට අවධානය




විදේශ සංචාරකයන්ට මෙරටට පැමිණීමට හැකිවන පරිදි ගුවන්තොටුපළ යළි විවෘත කිරීම සඳහා කොවිඩ් මාර්ගෝපදේශ අනුව සැලසුම් සකස් කර ඇති බවත් ඒ සඳහා සෞඛ්‍ය බලධාරීන්ගේ අනුමැතිය හිමිවූ වහාම ගුවන්තොටුපළ විවෘත කළ හැකි බවත් සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මහතා පැවසීය. මේ සම්බන්ධව සෞඛ්‍ය බලධාරීන් සමඟ විශේෂ සාකච්ඡාවක් ද පවත්වා තිබේ.

සංචාරක අමාත්‍යාංශයේ උපදේශක කාරක සභාවේදී චන්දිම වීරක්කොඩි, ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්, ඩයනා ගමගේ ඇතුළු මන්ත්‍රීවරුන් ගණනාවක් සිදුකළ ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් හෙතෙම මේ බව පැවසීය.

කොවිඩ් සෞඛ්‍ය මාර්ගෝපදේශයන්ට අනුව මෙරටට පැමිණෙන සංචාරකයන් සඳහා පහසුකම් සැපයීමට සංචාරක සේවා ස්ථාන 80ක් මේ වන විට හඳුනාගෙන තිබෙන බව සංචාරක සේවා අධිකාරියේ සභාපතිනිය වන කිමාලි ප්‍රනාන්දු මහත්මිය පැවසුවාය.

කෝවිඩ් මාර්ගෝපදේශයන්ට අනුව සංචාරක සේවා සැපයිය හැකි හෝටල් සහ සංචාරක කර්මාන්තයට අයත් ආයතනවලට මේ සඳහා ලියාපදිංචි විය හැකි බවත් සෞඛ්‍ය බලධාරීන් සමඟ එම සේවා ආයතනයන්හි තත්ත්වය පරීක්ෂා කර බලා ඒවා අනුමත කළ හැකි බවත් සභාපතිනිය පැවසුවාය.

ෆයිසර් සමාගම විසින් නිපදවන ලද කෝවිඩ් එන්නත අනුමත කරන ලද පළමු රට ලෙස එක්සත් රාජධානිය ප්‍රකාශයට පත් කර ඇති පසුබිමක යුරෝපය තුළද මෙම එන්නත ප්‍රචලිත වී සංචාරකයන්ගේ ප්‍රවර්ධනයක් ඇති වුවහොත් ගුවන් තොටුපළ කඩිනමින් විවෘත කිරීමට සිදුවිය හැකි බවද අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා නැගූ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් ඇය සඳහන් කළාය.

කමිටුව අමතමින් පාර්ලිමේන්තු මන්ත්‍රීනි ඩයනා ගමගේ මහත්මිය මෙරටට පැමිණෙන සංචාරකයින්ගේ ආරක්ෂාව පිළිබඳව සිය අවධානය යොමු කළේය.මෙම ප්‍රශ්නයට ප්‍රතිචාර දක්වමින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ සභාපතිනිය ප්‍රකාශ කළේ අතිගරු ජනාධිපතිතුමා විසින් පළමුවරට සංචාරකයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් නියෝජ්‍ය පොලිස්පතිවරයෙකු පත් කර ඇති බවයි.


තවද මෙරටට පැමිණෙන සංචාරකයන්ගේ ආරක්ෂාව වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට ජංගම යෙදුමක් (Mobile App) නිර්මාණය කර ඇති බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන මණ්ඩලයේ සභාපතිනිය පවසා සිටියාය. මෙම යෙදුමහි අන්තර්ගත පහසුකම් මඟින් සංචාරකයා සිටින ස්ථානය සහ ළඟම ඇති පොලිස් ස්ථානය සමඟ සබඳතාවය පවත්වා ගත හැකි බවත් මෙම ජංගම යෙදුම 2021 වසරේ දී හඳුන්වා දෙන බවත් ඇය වැඩිදුරටත් අනාවරණය කළාය.

මෙහිදී අදහස් දක්වමින් මඩකලපුවේ පාර්ලිමේන්තු මන්ත්‍රී එස්.රාසමානික්කම් මහතා උතුරු නැගෙනහිර ප්‍රදේශවල සංචාරක කර්මාන්තය දියුණු කිරීම සඳහා නව වැඩපිළිවෙලක අවශ්‍යතාව පෙන්වා දුන්නේය.

ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණය සහිත ස්ථාන 4956ක් දැනටමත් හඳුනාගෙන ඇති බවත් රාමායණය කතා පුවත සම්බන්ධ ශ්‍රී ලංකාවේ ස්ථාන ඉන්දියානු සංචාරකයන් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා දැනටමත් ඉන්දීය තානාපතිවරයා සමඟ කතා කර ඇති බවත් සභාපතිනිය මෙහිදී පැවසුවාය.

ගුවන්තොටුපල හා ගුවන් සේවා සභාපති මේජර් ජෙනරාල් ජී. ඒ. චන්ද්‍රසිරි මහතා ඩයනා ගමගේ මන්ත්‍රීවරියගේ විමසීමට ප්‍රතිචාර දක්වමින් ප්‍රකාශ කර සිටියේ ගුවන් තොටුපොළ මඟී තදබදයට විසඳුමක් ලෙස පළමු පන්තියේ මගීන්ට සහ ව්‍යාපාරික පන්තියේ මගීන්ට පහසුකම් සැලසීම සඳහා වෙනම ප්‍රවේශ දෙකක් දැනටමත් ස්ථාපිත කර ඇති බවත් එය ගුවන් තොටුපළ නැවත විවෘත කළ වහාම ක්‍රියාත්මක වන බවත්ය.





දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව
உள்நாட்டு இறைவரித் திணைக்களம் - இலங்கை
Inland Revenue Department - Sri Lanka

# 2018 වසරේ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ හිඟ ආදායම රුපියල් ට්‍රිලියන 1.3ක්

2018 වසරේ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ මුළු හිඟ ආදායම රුපියල් ට්‍රිලියන 1.3ක් බව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී අනාවරණය විය. මෙම හිඟ ආදායම්වලින් බහුතරය රාජ්‍ය ආයතන විසින් ගෙවිය යුතු ඒවා බවද, එම සමහර ආයතන අදාළ බදු ගෙවීම සඳහා සුදුසු මූල්‍ය තත්ත්වයක දැනට නොසිටින බව ස්වාධීන මණ්ඩලයක් විසින් තීරණය කර ඇති බව ද මෙහිදී දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් සඳහන් කෙරිණි. එම ආයතන පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් ලබා දෙන ලෙස කමිටුව විසින් ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත නිර්දේශයක් ලබා දෙන ලදි.

මෙම අතිවිශාල හිඟ බදු ආදායමට තවත් හේතුවක් ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් පෙන්වා දී තිබුණේ, රුපියල් බිලියන 03 ක වටිනාකමින් යුතු චෙක් පත් 8060ක චෙක්පත් අගරුවීම යි. ඒ සම්බන්ධව මේ වන විටද බදු ගෙවන්නන් 65කගෙන් යුතු අසාධු ලේඛනයක් සකස් කර ඇති බව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තු නිලධාරීහු කමිටුවට පෙන්වා දුන්හ. පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් කාරක සභාව හමුවට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව කැඳවා තිබුණු අතර, එම රැස්වීමට අමාත්‍යවරු සහ මන්ත්‍රීවරු රැසක්ද සහභාගීව සිටියහ.

2017 මුල් භාගයේ පටන් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව බදු අය කිරීම වඩා විධිමත්කරණය සඳහා RAMIS නම් පරිගණකගත පද්ධතියක් යොදාගෙන ඇති අතර ආදායම් බදු, ලිපි ගොනු මඟින් අය කිරීමට වඩා සාර්ථකත්වයක් එයින් දෙපාර්තමේන්තුව ලබා ඇති බව මෙහිදී නිලධාරීන් විසින් සඳහන් කරන ලදී.

එසේ වුවද, ගරු මන්ත්‍රීවරයන් විසින් පෙන්වා දුන්නේ, රු.බිලියන 4කට අධික මුදලක් වැය කර ස්ථාපිත කළ මෙම පද්ධතියට බදු සංශෝධනයක් සිදුවන සෑම අවස්ථාවකදීම එම තොරතුරු පද්ධතියට එක් කිරීමට සිංගප්පූරු සමාගමට තවත් රු.බිලියන 3කට වැඩි මුදලක් ගෙවීමට සිදුවීම නිසා ගැටලු සහගත තත්ත්වයක් උද්ගත වන බවයි. එනිසා, බදු සංශෝධන පිළිබඳව එක්වර ගෙවීම් සිදුකිරීමට සමාගම හා කිසියම් නිශ්චිත එකඟතාවයකට පැමිණිය යුතු බව අමාත්‍ය දුමින්ද දිසානායක මහතා විසින් යෝජනා කෙරිණි.

මෙහිදී කරුණු පැහැදිලි කළ මුදල් අමාත්‍යංශ ලේකම් සහ භාණ්ඩාගාර ලේකම් එස්. ආර්. ආටිගල මහතා මෙවර අයවැයෙන් වසර 05ක අඛණ්ඩ, ස්ථාවර බදු ප්‍රතිපත්තියක් යෝජනා කරන ලද්දේ බදු ගෙවන්නන්ගේ මෙන්ම එකතු කරන්නන්ගේ ද ප්‍රායෝගික පහසුව සඳහා බව පෙන්වා දුන්නේය.

ගරු ආචාර්ය හරිනි අමරසූරිය මහත්මිය මෙහිදී කළ විමසීමකට අනුව, ආදායම් බදු කොමසාරිස්වරයා කියා සිටියේ දැනට මාර්ගගත පද්ධතිය භාවිත කර දෙපාර්තමේන්තුවට බදු ගෙවන්නන් සිටින්නේ 12%ක් පමණක් බවයි. මේ තත්ත්වය ශීඝ්‍රයෙන් ඉහළ නැංවීම සඳහා මෙවර අයවැයේ පටන් ව්‍යාපාර ක්ෂේත්‍රයේ (Cooperate Sector) බදු ගෙවන්නන්ට මාර්ගගත පද්ධතිය භාවිතය අනිවාර්ය කර ඇතැයි ද මුදල් අමාත්‍යංශ ලේකම්වරයා මෙහිදී සඳහන් කළේය. කෙසේ වෙතත් මෙරට බදු එකතු නොකරන ප්‍රමාණය 30%ක් පමණ වෙතැයි කමිටු සභාපති තිස්ස විතාරණ මහතා සඳහන් කළ මතයද රට තුළ තිබෙන බවත් එම නිලධාරීහු පිළිගත්හ.

එහිදී නිලධාරීන් කළ පැහැදිලි කිරීමට අනුව, ශ්‍රී ලංකාවේ මහා පරිමාණයේ බදු ගෙවන්නන් 2192ක් සිටින අතර එයින් 532ක් බදු ආදායමෙන් 70.2% ක් ගෙවීමට දායක වෙයි.

මෙම රැස්වීමට, රාජ්‍ය අමාත්‍ය ලසන්ත අලගියවන්න, දුමින්ද දිසානායක මෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් වන තිස්ස අත්තනායක, ගුණපාල රත්නසේකර, අකිල වලේබොඩ, වීරසුමන වීරසිංහ, මහාචාර්ය රංජිත් බණ්ඩාර, අජිත් රාජපක්ෂ, ශ්‍රීවඥානම් ශ්‍රීධරන් සහ හරිනි අමරසූරිය යන මහත්ම මහත්මීහු සහභාගී වූහ.



# “දළ දේශීය නිෂ්පාදනය” වෙනුවට “දළ ජාතික සතුට” සොයන අසල්වැසි භූතානය



ලෝකයේ විශාලම ජනගහනයට හිමිකම් කියන චීනයට සහ ඉන්දියාවට මායිම්ව පිහිටි භූතානය, දකුණු ආසියානු කලාපයේ පිහිටි අපගේ අසල්වැසි රාජ්‍යයකි. බාහිර ලෝකයත් සමඟ සීමාසහිත සබඳතා පවත්වන භූතාන වැසියන් ගෙවන්නේ අතිශය සරල ජීවිතයකි. එසේම භූතාන රාජකීයත්වයේ, එරට රජයේ මෙන්ම එරට වැසියන්ගේ මුඛ්‍ය පරමාර්ථය වන්නේ පරිසර සංරක්ෂණයයි.

පරිසරය සුරැකීම භූතානයේ ප්‍රධානතම දේශපාලනික ප්‍රතිපත්තියයි. එරට රාජ්‍ය පාලන ව්‍යවස්ථාව මඟින්ම රටෙහි භූමි ප්‍රමාණයෙන් 60%ක් වන වැස්ම තිබිය යුතු බවට අවධාරණය කොට තිබෙන අතර වර්තමානය වන විට භූතානයෙ වන වැස්ම 72%ක් බවට පත්ව තිබේ. සිය වනාන්තර රැක ගැනීමේ අභිප්‍රායෙන් මේ වනවිටත් භූතානය තුළ තහනම් කර තිබෙන කර්මාන්තයක් ලෙස දැව අපනයනය පෙන්වාදිය හැකිය.

භූතානයේ ජිග්මේ ඛේසර් නම්ග්‍යාල් වන්චුක් රජු හා එතුමාගේ බිරිඳ වන ජෙට්සන් පෙමා බිසවගේ පුත් කුමරුවන්ගේ උපතේ ප්‍රීතිය නිමිත්තෙන් එරට 82,000ක් වූ රාජකීය පවුල, ගසක් බැගින් සිටුවා පරිසර හිතකාමීත්වය නිරූපණය කළේය. එය රටක් ලෙස පාලකයන් මෙන්ම රට වැසියන්ද පරිසර සංරක්ෂණය කිරීම උදෙසා දක්වන දායකත්වය මනාව පිළිබිඹු කරන්නකි.

මෙවන් ප්‍රයත්නයන් ඔස්සේ පරිසර සංරක්ෂණය සඳහා කැපව සිටින භූතානය ලෝකයේ ඇති එකම කාබන් සෘණ රට ලෙස, අන් සියලු රාජ්‍යන් හා ලෝක බලවතුන් අභිබවා ඉදිරියෙන්ම සිටින්නේ මුළු ලොව හමුවේම ආදර්ශයක් ලෙස නැගී සිටිමිනි. ෆොසිල ඉන්ධන දහනය හා වන විනාශය හේතු කොට ගෙන පෘථිවි වායු ගෝලයට එකතු වන ඔක්සිජන් ප්‍රමාණය අවමවීමත් කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය වැඩි වීමත් හේතුවෙන් හරිතාගාර ආවරණය සීමාව ඉක්මවා යමින් පවතී. එමඟින් මුළු මහත් ලෝක ජීව පද්ධතියටම එල්ලවන බලපෑම වර්තමානයේ පවත්නා ප්‍රබල ගැටලුවකි.

වායුගෝලයට මුදා හරිනු ලබන කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයත් වායුගෝලයෙන් උරා ගන්නා කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයත් මත පදනම් වූ කාබන් පා සලකුණ (Carbon Foot Print) සංකල්පය තුළ භූතානය හැරුණු කොට ලොව අන් සියලු රටවල් ශුද්ධ කාබන් විමෝචකයන් (Net Carbon Emitters) හෙවත් කාබන් ධන රටවල් වේ.

රටවල් සියල්ලම පරයා භූතානය මෙලෙස කාබන් සෘණ වුයේ කෙසේද යන්න පැහැදිලි කරමින් භූතාන හිටපු අගමැති ට්ෂෙරිං ටොබ්ගේ ටෙඩ් ටෝක් (TED Talks) සමඟ සම්බන්ධ වෙමින් පැවසුයේ, *”අපගේ රට තුළ වසරකට කාබන් ඩයොක්සයිඩ් ටොන් මිලියන 2.2ක්*

උපදවනු ලබනවා. නමුත් අපේ වනගහනය ඒ මෙන් තුන් ගුණයක් නැවත පෙරළා ලබා දෙනවා. එබැවින් භූතානය කියන්නේ වාර්ෂිකව කාබන්ඩයොක්සයිඩ් ටොන් මිලියන 6කට වඩා අවශෝෂණය කරගනු ලබන රටක්. එමෙන්ම, භූතානය වේගයෙන් ගලන ගංගා මඟින් උපදවන පුනර්ජනනීය විදුලිය අපනයනය කරනු ලබනවා. එබැවින් භූතානය අපනයනය කරන පිරිසිදු බලශක්තිය අපේ අවට තිබෙන කාබන්ඩයොක්සයිඩ් මිලියන 6කින් පමණ සමතුලිත කරනු ලබනවා. 2020 දි අපි අපනයනය කරන්න සැලසුම් කරපු විදුලි ප්‍රමාණය ගත් විට, සමතුලිත වන කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය ටොන් මිලියන 17ක් පමණ වේවි. තවත් කලක් ගතවන විට අප විසින් අපනයනය කරන පිරිසිදු කාබනික බලශක්තිය වාර්ෂිකව කාබන්ඩයොක්සයිඩ් ටොන් මිලියන 50ක් පමණ සමතුලිත කරනු ඇති. මෙය එක් වසරකදී නිව්යෝක් නගරය උත්පාදනය කරන කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයටත්  වඩා වැඩියි. ඉතින් අපි රට තුළදී කාබන් අවශෝෂණය කරන කොට රටෙන් පිටතදි කාබන් සමතුලිත කරනවා" යනුවෙනි. භූතානය සිය සාර්ථකත්වය මැනීමට" දළ දේශීය නිෂ්පාදනය" (GDP) යන මිනුම් දණ්ඩ වෙනුවට යොදා ගනු ලබන්නේ "දළ ජාතික සතුට" (GNH) කියන මිනුම් ක්‍රමය වීමද භූතානයේ තිබෙන විශේෂත්වයකි. මෙම ක්‍රමය හඳුන්වා දීමේ ප්‍රධානතම අභිප්‍රාය වුයේ භූතාන ජාතිකයින්ගේ සතුට සහ යහ පැවැත්ම පාරිසරික, සමාජීය හා ආර්ථික වශයෙන් වැඩිදියුණු කිරීමයි.  මෙම සංකල්පය භූතානයට 1972 වර්ෂයේදී හඳුන්වා දෙනු ලැබුයේ එවකට භූතානයේ රජුව සිටි ජිග්මේ සින්ග්යේ වන්චුක් (Jigme Singye Wangchuck) විසිනි.

මෙවන් කුඩා රාජ්‍යක් වන භූතානයෙන් ආභාසය ලබමින් ඉදිරි වර්ෂයන් තුළදී කාබන් උදාසීන රටවල් අතරට එක්වීම සඳහා අත්වැල් බැඳගෙන ඇති රටවල් අතරට චීනය, ෆින්ලන්තය, නවසීලන්තය, ජපානය, බ්‍රිතාන්‍ය, ඩෙන්මාර්කය වැනි රටවල්ද එක්වීමත් සමඟම අනාගතය වෙනුවෙන් සොබාදහම රැකගැනීම සඳහා වූ පරාර්ථකාමී ගමන් මඟ වෙනුවෙන් මං පෙත් විවර වනු නොඅනුමානය.

*මාධවී රංගේබණ්ඩාර*
*මාධ්‍ය නිලධාරී*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*

**පුවත්**

# සියලු රාජ්‍ය ආයතන නියමිත කාල සීමාව තුළ වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතු බවට කෝප් කමිටුවෙන් නිර්දේශයක්




නියමිත කාල සීමාව තුළ රාජ්‍ය ආයතන සියල්ල සිය  පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (කෝප්) අවධාරණය කර තිබේ

කොප් කමිටුවේ සභාපති ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මහාචාර්ය චරිත හේරත් මහතා විසින් ලිඛිතව  සියලු අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත මේ බව දන්වා යවා ඇති අතර, තම අමාත්‍යාංශය යටතේ පවතින රාජ්‍ය ආයතන සෑම මුදල් වර්ෂයක් අවසානයේ සිට දින 150ක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි සිය වාර්ෂික වාර්තා සකස් කළ යුතු බව එහි සඳහන් වේ

පසුගිය නොවැම්බර් 24 වැනිදා රැස්වූ කෝප් කමිටුව රාජ්‍ය ආයතන සැලකිය යුතු ප්‍රමාණයක් නියමිත කාල සීමාව තුළදී වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට එවා නොමැති බවට නිරීක්ෂණය කර තිබේ.

මේ හේතුවෙන් බොහෝ විට ලැබෙන වාර්ෂික වාර්තාවල යල් පැන ගිය තොරතුරු ඇතුළත් වන බවත් ඒ හේතුවෙන් නිසි කාලසීමාවන්හිදී අදාළ වාර්තාවල දත්තයන්ට අනුව පියවර ගැනීමට නොහැකි වී ඇති බවත් කෝප් කමිටුව විසින් නිරීක්ෂණය කර තිබේ.

# සභාගර්භයේ මූලාසනය කථානායක අසුනයි





අභිනව පාර්ලිමේන්තුවේ ප්‍රථම කාර්යය වන්නේ කථානායකවරයකු පත්කර ගැනීමයි. ව්‍යවස්ථාදායකය තුළ කථානායකතුමාට හිමිවන්නේ ප්‍රමුඛතම ස්ථානයකි. පාර්ලිමේන්තුවේ ප්‍රධානියා ලෙස කථානායකතුමාට තම කටයුතු කරගෙන යාමට සභාගර්භයේ ප්‍රධාන ආසනය වෙන්කර තිබේ. මූලාසනය නොහොත් කථානායක ආසනය ලෙස එම ආසනය හඳුන්වයි.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නව පාර්ලිමේන්තුව මන්දිරය විවෘත කිරීමත් සමඟ එහි සභාගර්භයේ භාවිතයට නව කථානායක ආසනයක් නිර්මාණය කෙරිණි. 1978 වසරේදී කොළොන්නාවේ පිහිටි රජයේ කර්මාන්ත ශාලාවේදී එය නිර්මාණය කර තිබේ. උස අඩි පහමාරක් පමණ වන මෙම ආසනයේ පාද, සිංහයකුගේ පාද ආකාරයට කැටයම් කර ඇති අතර, ආසනේ උඩ කොටසේ දෙපස අලංකාර පුන්කලස් දෙකක්ද, ඊට උඩින් දෙපසට මුහුණලා සිටින මකර රූප වලට මැද සදාතනිකභාවය  සංකේතවත් කරන, ඉර හා සඳ කැටයම් කර තිබේ. ආසන ශීර්ෂයේ කථානායකතුමාගේ ලාංඡනය වන ශ්‍රී ලංකා ජනරජයේ ලාංඡනය ඔබ්බවා ඇත.

සභාවේ මේසය නමින් හඳුන්වන කථානායකතුමාගේ මේසය ද ඉතා වැදගත් තැනක් ගනී. එහි ප්‍රධාන වශයෙන් පාර්ලිමේන්තු ස්ථාවර නියෝගද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවද, න්‍යාය පුස්තකය හා න්‍යාය පත්‍රය ඇතුළු වැදගත් ලිපි ලේඛන තබා තිබේ. ඊට අමතරව කථානායකතුමාට සභාව අවනත කර ගැනීමට නැතහොත් නිශ්ශබ්ද කරගැනීමට භාවිතා කරන



මිටියද මේසයේ දකුණු අත පසෙක තබා තිබේ.

පාර්ලිමේන්තුවේ නව සැසිවාරයක් ආරම්භ කිරීමේදී හෝ විශේෂිත උත්සව අවස්ථාවකදී මූලාසනයේ අසුන් ගන්නා අතිගරු ජනාධිපතිතුමන් හටද විශේෂිත වූ ආසනයක් පාර්ලිමේන්තුවේ තබා ඇත. එම ආසනයද කථානායකතුමාගේ ආසනය මෙන් නිම කරවා තිබේ. එහි ශීර්ෂයේ ජනරජ ලාංඡනය වෙනුවට ජනාධිපතිතුමන්ගේ නිල ලාංඡනය දක්නට ලැබේ.

වර්තමානයේදී හත්වන විධායක ජනාධිපතිතුමන් වන ගෝඨාභය රාජපක්ෂතුමාගේ නිල ලාංඡනය වන්නේ පාරිශුද්ධත්වය සංකේතවත් කරන සුදු නෙළුම් මලයි. එම ආසනය අතිගරු ජනාධිපතිතුමන් සභාවේ මූලාසනය හොබවන සෑම අවස්ථාවකදීම සභාගර්භට ගෙන ඒම විශේෂත්වයකි.

***එස්.ජෙය ප්‍රකාශ්***
***මහජන සේවා සම්බන්ධීකරණ නිලධාරී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***





පුවත්

# අමාත්‍යාංශ ලේකම්වරුන් 07 දෙනෙකු සහ තානාපති නිලධාරිවරයෙකුගේ පත්වීම් සඳහා උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමැතිය





අමාත්‍යාංශ ලේකම්වරුන් 07 දෙනෙකු සහ තානාපති නිලධාරිවරයෙකුගේ පත්වීම් සඳහා පාර්ලිමේන්තුවේ උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ අනුමැතිය හිමි වූ බව මහලේකම් ධම්මික දසනායක මහතා පැවසීය.

කටුනායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැති මෙම උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ දී අනුමැතිය හිමි වූ අමාත්‍යාංශ ලේකම්වරුන් අතර, පරිසර අමාත්‍යාංශයේ ලේකම් වෛද්‍ය අනිල් ජාසිංහ මහතා ද වෙයි.

ඔහුට අමතරව ජලසම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ලෙස අචාර්ය ප්‍රියත් බන්දු වික්‍රම මහතාටත්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ලෙස මහාචාර්ය කපිල පෙරේරා මහතාටත්, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම් ලෙස එම්. එම්. පී. කේ. මායාදුන්නේ මහතාටත් අනුමැතිය හිමි වූ බව මහලේකම්වරයා පැවසීය.ඊට අමතරව විදේශ අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස මහාචාර්ය අද්මිරාල් ජයනාත් කොළඹගේ මහතාටත්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස රවීන්ද්‍ර හේවාවිතාරණ මහතාටත්, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස යූ. ඩී. සී. ජයලාල් මහතාටත් අනුමැතිය හිමිවූ බව පාර්ලිමේන්තුවේ මහලේකම්වරයා වැඩිදුරටත් සඳහන් කළේය.

එමෙන්ම, කටාර් රාජ්‍යයේ නව ශ්‍රී ලංකා තානාපතිවරයා ලෙස එම්. මොහොමඩ් මහතා පත්කිරීමට ද, කාරක සභාවේ අනුමැතිය හිමිව තිබේ.

# ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ නඩු තීන්දු සිංහල භාෂාවෙන් ද ලබා දීම කෙරෙහි රජයේ අවධානය




ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ නඩු තීන්දු සිංහල භාෂාවෙන් ද ලබා දීම කෙරෙහි සලකා බලන බව අධිකරණ අමාත්‍ය අලි සබ්‍රි මහතා පාර්ලිමේන්තුවේ දී පැවසීය.

පාර්ලිමේන්තු මන්ත්‍රී යදාමිණී ගුණවර්ධන මහතා වාචික පිළිතුරු අපේක්ෂාවෙන් යොමු කළ ප්‍රශ්නයකට පිළිතුරු දෙමින් හෙතෙම මේ බව කීවේය.

දැනටමත් අධිකරණවල නඩු විභාග වීමේ ප්‍රමාදයක් පවතින බවත්, එම තත්ත්වය තව දුරටත් උග්‍ර නොවන අයුරින් විෂයගත කරුණු පිළිබඳව සලකා බලන බවත් අමාත්‍යවරයා වැඩිදුරටත් සඳහන් කළේය.

## විශේෂාංග


# වාමාංශික අසුන රැකගත් කුසුම්සිරි ගුණවර්ධන



1912 මැයි මස 26 වන දින  තංගල්ලේ, මැදකැටිය ග්‍රාමයේදී දොන් ඩේවිත් අමරසිංහ සහ සොෆිනෝනා යුවලට දාව උපත ලද කුසුම්සිරි අමරසිංහ තංගල්ලේ රාහුල මහා විද්‍යාලය, මාතර ශාන්ත මරියා කන්‍යාරාමය සහ කොළඹ මියුසියස් විද්‍යාලයෙන් අධ්‍යාපනය හැදෑරුවාය. 1939 ජුනි 30 වන දින ඇය ශ්‍රී ලංකාවට ට්‍රොට්ස්කිවාදය හඳුන්වා දුන්, 'සමාජවාදයේ පියා' ලෙසින් සහ 'බොරළුගොඩ සිංහයා' ලෙසින් හැඳින්වෙන දොන් පිලිප් රූපසිංහ ගුණවර්ධන  සමඟ විවාහ විය.

සූරිය මල් ව්‍යාපාරය හා එක්ව කටයුතු කළ ඇය පසුව ලංකා සමාජ සමාජ පක්ෂයට බැඳී කටයුතු කළාය. දෙවන ලෝක සංග්‍රාම සමයේදී ඇයගේ සැමියා ලංකාවේ රැඳවුම් භාරයෙන් ඉන්දියාවට පළා ගියේය. 1943 දී බොම්බාය නගරයේදී ඔවුහු අත්අඩංගුවට පත් වූහ. මාස ගණනාවකින් පසු ඔවුන් ලංකාවට පිටුවහල් කළ අතර 1947 දී පළමු පාර්ලිමේන්තු මැතිවරණයේදී අවිස්සාවේල්ල මැතිවරණ දිස්ත්‍රික්කයෙන් ඡන්ද 17598ක් හිමිකරගෙන, ලංකා සම සමාජ පක්ෂය නියෝජනය ඇයගේ සැමියා වූ පිලිප් ගුණවර්ධන තේරී පත්වුවද  1947 දී මහා වැඩ වර්ජනයේදී සීමාසහිත සවුත් වෙස්ටර්න් බස් රථ සමාගම් සේවකයන් වර්ජනයට පෙළඹවීම යන චෝදනා ලද පිලිප් ගුණවර්ධන මහතාට බරපතළ වැඩ සහිතව තෙමසක සිර දඬුවම් නියම වූ අතර ඊට සම්බන්ධ වීම හේතුවෙන් 1948 දී ඉදිරිපත් වූ ඡන්ද පෙත්සමකට අනුව ඔහු පාර්ලිමේන්තුවෙන් නෙරපා හරින ලදී.

වර්ෂ ගණනාවක් මුළුල්ලේ ඔහුගේ ඔහුගේ ප්‍රජා අයිතිවාසිකම් අහිමි වීම හේතුවෙන් ඔහු වෙනුවට




*කුසුම්සිරි ගුණවර්ධන මැතිනිය අවිස්සාවේල්ල මන්ත්‍රීවරිය ලෙස පත් වී කොළඹ කච්චේරියෙන් පිටතට පැමිණි මොහොත*

ඔහුගේ බිරිඳ වූ කුසුම්සිරි ගුණවර්ධන 1948 දී නාමයෝජනා භාරදීමෙන් ආරම්භ වූ අතුරු මැතිවරණයෙන් තේරී පත් වූ ශ්‍රී ලංකාවේ තේරී පත් වූ දෙවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරිය බවට පත්වුවාය.

ඇය 1952දී  විප්ලවකාරී ලංකා සමාජ සමාජ පක්ෂය නියෝජනය කරමින් දෙවන පාර්ලිමේන්තු මැතිවරණ ජය ගෙන එම ධූරය රඳවා ගත්තාය. දේශපාලන තරඟබිමෙහි අවිස්සාවේල්ල මැතිවරණ දිස්ත්‍රික්කය අසුන අතහැර 1956 පාර්ලිමේන්තු මැතිවරණය සඳහා ඇය කිරිඇල්ල මැතිවරණ දිස්ත්‍රික්කයෙන් තරඟ කළ අතර 1960 මාර්තු පාර්ලිමේන්තු මැතිවරණයේදී ආසනය ගැනීමට ඇය අපොහොසත් විය.

1957 ලන්ඩනයේ පොදු රාජ්‍ය මණ්ඩලයීය පාර්ලිමේන්තු සම්මේලනයට නියෝජිතයා ලෙස කටයුතු කළ ඇය, කාන්තාවන්ට සමාන ලෙස සැලකීම, සිවිල් සේවයට කාන්තාවන් බඳවා ගැනීම සහ රජයේ දෙපාර්තමේන්තු වල ජ්‍යෙෂ්ඨ තනතුරු සඳහා පත් කිරීම යන කරුණු සඳහා වැඩි අවධානයක් ලබා දුන්නාය. හැන්සාඩ් වාර්තාවලට අනුව ඇය පාර්ලිමේන්තුව තුළ සිංහල භාෂාවෙන් ඇමතූ ප්‍රථම කාන්තා මන්ත්‍රීවරිය ද වූවාය. ඒ කාල වකවානුවේ චතුර ලෙස භාෂාව හසුරවමින් සිංහල භාෂාව පිළිබඳ වූ ඥානය ඇයට ආභරණයක් වූ අතර සිංහල භාෂාවෙන් වැඩිපුරම කතාකළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරිය ලෙසද ඇය ප්‍රචලිත වූවාය.

පිලිප් ගුණවර්ධන සහ කුසුම්සිරි ගුණවර්ධනහට දරුවන් පස් දෙනෙක් වූ අතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා කැබිනට් සාමාජිකයෙකු වූ ඉන්දික ගුණවර්ධන, 2002 සිට 2006 දක්වා කොළඹ නගරාධිපති වූ ප්‍රසන්න ගුණවර්ධන, කොළඹ මැතිවරණ දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ නියෝජනය කරන වර්තමානයේ විදේශ අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායක ධූරය හොබවන ශ්‍රී ලංකාවේ දේශපාලනඥයෙක් වූ දිනේෂ් චන්ද්‍ර

රූපසිංහ ගුණවර්ධන, මන්ත්‍රීවරයකු සහ නියෝජ්‍ය අමාත්‍යවරයෙක් වූ ගීතාංජන ගුණවර්ධන සහ ප්‍රවීණ ලේඛිකා, රාජ්‍ය සම්මානලාභී සාහිත්‍ය ජයග්‍රාහිකාවක් වූ ලක්මාලි ගුණවර්ධන ඔවුන්ගේ දියණිය විය. එපමණක් නොව අද ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරයක් හොබවමින් පාර්ලිමේන්තුවට පිවිස සිටින ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී යදාමිණී ගුණවර්ධන ජාතික දේශපාලනයේ නිරත ඇගේ ඊළඟ පරපුර නියෝජනය කරයි.



*සැමියා වූ පිලිප්, පුතුන් වූ ඉන්දික, ප්‍රසන්න, දිනේෂ්, ගීතාංජන සහ දියණිය ලක්මාලි සමඟ කුසුමිසිරි ගුණවර්ධන*

විවිධ අභියෝග හමුවේ නොසැලෙමින් උපන් බිමට සේවය කළ එතුමිය 1986 මැයි 30 වන දින වයස අවුරුදු හැත්තහතරේදී මිය ගියාය.

ළාබාලතම මන්ත්‍රිනී **තමරා කුමාරි ඉලංගරත්න මැතිනියගේ** දේශපාලන තතු පිළිබඳ ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න.

***ඉෂාරා වික්‍රමසිංහ***
***මහජන සේවා නිලධාරී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***



# වසර 2025 වන විට විදුලි ඉල්ලුම සම්පූර්ණ කිරීම සඳහා සැලසුම්

වසර 2025 වන විට මෙරට විදුලි ඉල්ලුමට සරිලන විදුලි සැපයුමක් සම්පූර්ණ කිරීම සඳහා විදුලි ජනනය ඉහළ නැංවීමට විදුලි බලාගාර සහ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති රැසක් ඉදිරි කාලසීමාවේ ආරම්භ කරන බව විදුලිබල අමාත්‍ය ඩලස් අලහප්පෙරුම මහතා පාර්ලිමේන්තුවේදී හෙළි කළේය.

මේ අනුව මෙගා වොට් 300ක ධාරිතාවයකින් යුතු ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) බලාගාරයක් කෙළවරපිටියේදී ඉදිකරන බවත් එහි වැඩකටයුතු ලබන මාසයේ පළමු දෙසතිය තුළ ආරම්භ කරන බවත් අමාත්‍යවරයා පැවසීය.

තවද මෙගා වොට් 300ක ධාරිතාවයෙන් යුතු කෙළවරපිටිය - 2 බලාගාරය සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සහ ටෙන්ඩර් ප්‍රදානය කිරීමේ කටයුතු 2021 මුල් මාස 06 තුළ සිදුකරන බවත් ඉන්ධන සැපයුම සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙන් අනතුරුව 2024 වන විට මෙහි වාණිජ කටයුතු ආරම්භ කිරීමට නියමිත බවත් අමාත්‍යවරයා සඳහන් කළේය.

කොළඹ ආශ්‍රිත මෙගාවොට් 650 ක ධාරිතාවයකින් යුතු තාප බලාගාර, ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) බලාගාර බවට පත්කිරීම සිදුකරන බවත් මේ යටතේ කැළණිතිස්ස, කෙළවරපිටිය, සපුගස්කන්ද යන බලාගාර ඩීසල් සහ නැප්තාවලින් ක්‍රියාකරන ද්‍රවීකෘත ස්වභාවික වායු (LNG) බලාගාර බවට පත්වන බවත් අමාත්‍යවරයා පැවසුවේය.


ලංකා විදුලි බල මණ්ඩලයේ ඇස්තමේන්තු අනුව 2025 වන විට ගිගාවොට් පැය 22500ක විදුලි ජනනයක් සිදුකළ යුතු බව පුරෝකථනය කර ඇති බවත් 2013 වර්ෂයේ සිට මේ දක්වා ජාතික විදුලි බල පද්ධතියට ප්‍රධාන බලාගාරයක් එක් වී නැති බවත් අලහප්පෙරුම මහතා පෙන්වා දුන්නේය. එබැවින් තාප බලාගාර, ද්‍රවීකෘත ස්වභාවික වායු ( LNG )බලාගාර ප්‍රමුඛව මෙම ඉල්ලුම සම්පූර්ණ කිරීමට පියවර ගන්නා බව අමාත්‍යවරයා පැවසීය.

නොරොච්චෝලේ විදුලි බලාගාරයේ හතරවන අදියර ආරම්භ කිරීම සඳහා පසුගිය පෙබරවාරි මාසයේ කැබිනට් අනුමැතිය හිමිවී ඇති අතර මෙගාවොට් 300ක ධාරිතාවයෙන් යුතු මෙහි වැඩකටයුතු ආරම්භ කිරීමට නියමිතය.




# රිදී දොරටුව





පාර්ලිමේන්තු සභාගර්භයට පිවිසෙන ප්‍රධාන දොරටුව වන මෙය පෞරාණික ලාංකේය කලා සම්ප්‍රදාය ඉස්මතු වන අයුරින් නිර්මාණය කර ඇත. ලෝහ මුද්‍රණ ශිල්පී විමල් සුරේන්ද්‍ර විසින් නිමවා, දර්ශනීය කැටයමින් අලංකාර කර ඇති මෙම දොරටුව තඹ හා රිදියෙන් තැනුණකි. දිගින් අඩි 12ක් ද, පළලින් අඩි 12කින්ද යුතු දොරටුවට ත්‍රිමාණ ස්වරූපයෙන් නිර්මාණය කර ඇත. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පූර්විකාව සිංහල, දමිළ හා ඉංග්‍රීසි බසින් සටහන් කළ දොරටුවෙන් ඇතුළුව, සභාගැබෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට පිවිසෙන්නෙකුට නිසැකයෙන්ම දැනෙන්නේ අභිමානනීය හැඟීමකි. දොරටුවේ පිටත මායිමෙහි පුරාණ ශ්‍රී ලංකාවේ කලා ශිල්ප පිළිබිඹු කරන දර්ශනීය නෙළුම් මල් රටා සහ සැරසිලි මෝස්තර කැටයම් කර ඇත. දොරටුවේ පිටුපසින් දක්නට ලැබෙන සැරසිලි මෝස්තරය බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ ඇති සිතුවමකින් ආභාසය ලත් ආකර්ෂණීය නිමැවුමකි.

*රශ්මියා නූටාන්*
*මහජන සේවා නිලධාරී*
*සන්නිවේදන දෙපාර්තමේන්තුව*

## කර්තෘ මණ්ඩලය

*උපදේශනය*

ධම්මික දසනායක මහතා (පාර්ලිමේන්තු මහලේකම්)

කුෂාණි රෝහණධීර මහත්මිය (නියෝජ්‍ය මහලේකම් හා කාර්ය මණ්ඩලයේ ප්‍රධානී)

ටිකිරි කේ. ජයතිලක මහතා (සහකාර මහලේකම්)

*සංකල්පය හා මඟපෙන්වීම*

ශාන් විජේතුංග මහතා

*ප්‍රධාන සංස්කරණය*

බුද්ධිනි රාමනායක මෙනෙවිය

එදිරිවීර ගුණසේකර මහතා

නිම්මි හාතියල්දේණිය මහත්මිය

*ඡායාරූපකරණය*

නුවන් දුමින්ද මහතා

*පිටු සැලසුම්කරණය*

ඉෂාරා වික්‍රමසිංහ මෙනෙවිය

*අන්තර්ජාලය හරහා බෙදාහැරීම*

වී.ජී.එම්.එම්.නුස්කි මහතා

# නිලධර වින්නි



**එච්. ඊ. ජනකාන්ත සිල්වා මහතා**
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)
පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුවේ සභාලේඛන කාර්යාංශයේ (Table Office) වර්තමාන සහකාර අධ්‍යක්ෂවරයා ලෙස වැඩකටයුතු ඉටුකරන එච්. ඊ. ජනකාන්ත සිල්වා මහතා ලිපිකරුවෙකු ලෙස පාර්ලිමේන්තු සේවයට එක්වූයේ 1990 ජනවාරි මාසයේදීය. ජනකාන්ත සිල්වා මහතා රෝමයේ උර්බානු විශ්ව විද්‍යාලයෙන් දර්ශනවාදය පිළිබඳ උපාධිය හිමිකරගෙන තිබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය (Constitutional Law) සහ පාර්ලිමේන්තු ක්‍රියාදාමයන් හා පරිචයන් පිළිබඳ ඩිප්ලෝමා දෙකක්ද, පාර්ලිමේන්තු ව්‍යවස්ථා සම්පාදනය (Legislative Drafting) පිළිබඳ විශේෂ නේවාසික පුහුණු පාඨමාලාවක්ද, පිළිවෙළින් ඉන්දියාවේ ICPS සහ BPST යන ආයතනවලින් ඔහු ලබාගෙන ඇත.

ඊට අමතරව, ස්වීඩනය, චීනය, එංගලන්තය, කැනඩාව යනාදී රටවලදී විශේෂ වෘත්තීමය පුහුණු පාඨමාලාවලටද සහභාගී වී වසර 31ක පාර්ලිමේන්තු සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ජනකාන්ත සිල්වා මහතා ඉන් වසර 24ක කාලයක්ම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා දෙපාර්තමේන්තුවේ සේවය කර තිබීම විශේෂත්වයකි.



**සරෝජිනි රම්‍යලතා ගුණරත්න මහත්මිය**
නියෝජ්‍ය අධ්‍යක්ෂ
පරිපාලන දෙපාර්තමේන්තුව

බම්බලපිටිය ලින්ඩ්සේ විද්‍යාලයෙන් සහ කොළඹ විශාකා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හදාරා ඇති සරෝජිනි රම්‍යලතා ගුණරත්න මහත්මිය කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හිමිකරගෙන තිබේ.

1987 වසරේ ඔක්තොම්බර් මස 01 වැනි දින පාර්ලිමේන්තු නිලධාරිනියක ලෙස සේවයට එක්වන ඇය ආයතන අංශයෙත්, කෝප් සහ කෝපා කාර්යාලයේත්, මුදල් හා ගිණුම් අංශයෙත් සේවය කර ඇත.

වර්තමානයේ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පරිපාලන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරිය ලෙස කටයුතු කරන ඇයගේ පාර්ලිමේන්තු සේවා කාලය වසර 34 කට ආසන්නය. විදෙස් පුහුණුවීම් කිහිපයකටම ඇය සම්බන්ධ වී තිබේ.



**සී. කලන්සූරිය**
සහකාර අධ්‍යක්ෂ - පරිපාලන
මානව සම්පත් සංවර්ධන කාර්යාලය

මතුගම ආනන්ද ශාස්ත්‍රාලයෙන් සහ ගාල්ල මහින්ද විද්‍යාලයෙන් අධ්‍යාපනය හදාරා ඇති සී.කලන්සූරිය මහතා 1983.04.04 දින පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට එක්විය.

පාර්ලිමේන්තුවේ පරිපාලන හා ව්‍යවස්ථාදායක දෙපාර්තමේන්තු වල වසර 38 කට ආසන්න කාලයක් විවිධ තනතුරුවල මෙතෙම සේවය කර තිබේ.

2006.07.03 දින සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) තනතුරට උසස්වීම් ලද කලන්සූරිය මහතා මේ වන විට මානව සම්පත් සංවර්ධන කාර්යාලයට අනුයුක්තව සේවය කරමින් සිටිය.

ඔස්ට්‍රේලියාව, මැලේසියාව, සිංගප්පූරුව, ඉන්දියාව, ජපානය, මාලදිවයින සහ එක්සත් රාජධානිය වැනි රටවල පාර්ලිමේන්තුවල පුහුණු සැසිවලට ද ඔහු එක්ව තිබීම විශේෂත්වයකි.

# ඡායා ගැලරිය

## තිරසර රටකට - පරිසර සුරැකුම








## කථානායකතුමා රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තර කරයි







## දේශපාලනයේ සම අවස්ථා සහ සම අයිතීන් අපේ කාන්තාවන්ට හිමිද?








සන්නිවේදන දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100
ෆැක්ස් : +94 11 2777227

Parliament of Sri Lanka
@ParliamentLK
@slparliament
Parliament of Sri Lanka